// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2459/12 - 2025 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා - 2025.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නියෝග අංක : 94**

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත (සංශෝධිත)**

20 (5) වගන්තිය යටතේ නියෝගය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම ආනයනකරුවෙකු, සැපයුම්කරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් පහත දක්වා ඇති ආනයනික සහල් වර්ග එහි සඳහන් කර ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *වර්ගය* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| කැකුළු සහල් - ආනයනික | කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 210/- |
| නාඩු සහල් - ආනයනික | කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 220/- |
| සම්බා සහල් - ආනයනික | කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 230/- |
| පොන්නි සම්බා - GR 11 (කීරි සම්බාවලට සමාන) - ආනයනික | කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 240/- |
| කීරි පොන්නි හෝ පාල් පොන්නි GR 11 - ආනයනික | කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 255/- |

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2024 දෙසැම්බර් 09 වැනි දින අංක 2414/04 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියෝග අංක 91 මෙම නියෝගය මගින් පරිච්ඡින්න කරනු ලැබේ.

මෙම නියෝගය 2025 ඔක්තෝබර් මස 21 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**හේමන්ත සමරකෝන්,**
සභාපති.

2025 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

EOG - 10 - 0203

1A - PG 7294 — 53 (2025/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.